# ඇබෑර්තු

## ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය

# කොළඹ වරාය නගර සංවර්ධන ව්‍යාපෘතිය

## ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU)

ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කොළඹ වරාය නගරයෙහි පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා, අවශ්‍ය සුදුසුකම් සහිත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

| අනු අංකය | තනතුර | අංක 01/2019 චක්‍රලේඛය ප්‍රකාරව වැටුප් වර්ගීකරණය | තනතුරු ගණන |
|---|---|---|---|
| 01 | ඉංජිනේරු (MEP) | PS-04 | 01 |
| 02 | සිවිල් ඉංජිනේරු (යටිතල පහසුකම්) | PS-04 | 01 |

අවශ්‍ය වැඩිදුර විස්තර සඳහා, කරුණාකර ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ (MIP) වෙබ් අඩවිය වන **https://mip.gov.lk** වෙත යොමු වන්න.

**අයදුම් කරන පිළිවෙල**

අයදුම්කරුවන් විසින්, A4 ප්‍රමාණයේ කඩදාසිවල සකස්කරගත් අයදුම්පත් අදාළ සුදුසුකම් පළපුරුද්ද හා අනෙකුත් අදාළ තොරතුරු සමග දුරකථන අංක හා ඊමේල් ලිපිනයන් ඇතුළත්ව ලියාපදිංචි තැපැලෙන් / ඊමේල් මාර්ගයෙන් පහත සඳහන් ලිපිනය වෙත 2024 ජූලි 22 දිනට පෙර ලැබෙනසේ එවිය යුතුය. අයදුම්කරනු ලබන තනතුර අයදුම්පත් බහාලූ කවරයේ වම් ඉහළ කොළවරේ සඳහන් කළ යුතුය. රජයේ දෙපාර්තමේන්තුවල හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් එවිය යුතු අතර, එම ප්‍රධානී විසින් අයදුම්කරු මෙම තනතුරට තෝරාගත හොත් දැනට දරන තනතුරින් නිදහස් කළ හැකිද යන කරුණු සඳහන් කළ යුතුය.

**ලේකම්,**
**ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය,**
**12 වන මහල, බටහිර කුළුන,**
**ලෝක වෙළඳ මධ්‍යස්ථානය,**
**කොළඹ 01.**
**ඊමේල් ලිපිනය : minofinternalaffairs@gmail.com**
**2024.06.28**